# ආදිවාසික හා ටෝ්රස් සමුද්‍ර සන්ධි දූපත්වාසික හඬ ජනමත විචාරණය

ජනමත විචාරණයේ දී ඡන්දය ප්‍රකාශ කරන ලෙස ළඟ දීම ඕස්ට්‍රේලියානු ඡන්දදායකයන්ගෙන් ඉල්ලා සිටීම සිදු වනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආදිවාසී සහ ටෝ්රස් සමුද්‍ර සන්ධි දූපත්වාසී හඬක් පාර්ලිමේන්තුව තුළ තිබිය යුතු ද යන්න ජනමත විචාරණයෙන් විමසනු ඇත. පාර්ලිමේන්තුව යනු ඕස්ට්‍රේලියාව සඳහා නීති සම්පාදනය කරන ආයතනයයි.

## පාර්ලිමේන්තුව කරා වන හඬ යනු කුමක්ද?

Voice යනු ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාදී වැසියන්ට ඔවුන්ට බලපාන නීති ගැන රජයට උපදෙස් දීම සඳහා වන මාර්ගයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට Voice  ඇතුළත් කිරීමෙන් ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන්ට බලපාන ගැටලු සම්බන්ධයෙන් රජයට උපදෙස් සැපයීමේ දී Voice වෙත ස්ථිර කාර්යභාරයක් පවතිනු ඇති බවයි. ආදිවාසී සහ ටෝ්රස් සමුද්‍ර සන්ධි දූපත්වැසියන් ව්‍යවස්ථාපිතව පිළිගැනීමට සහ ඔවුන්ගේ සංස්කෘතිය ඇගයීමට සහ සැමරීමට පාර්ලිමේන්තුව කරා වන Voice  මගින් අවස්ථා සලසනු ඇත.

## ආදිවාසී සහ ටොරස් සමුද්‍රසන්ධි දූපත්වාසීන් පාර්ලිමේන්තුව කරා වන Voice ඉල්ලන්නේ ඇයි?

ආදිවාසී සහ ටෝ්රස් සමුද්‍ර සන්ධි දූපත්වාසීහු වසර 100 කට ආසන්න කාලයක් තිස්සේ රජය විසින් පිළිගනු ලැබීම ඉල්ලා සිටිති. ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධියේ දූපත්වාසීහු සිය ප්‍රජාවන් සහ සංස්කෘතිය ගැන හොඳින් ම දැන සිටිති. ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන් සඳහා වඩාත් සාධාරණ, සාධාරණ අත්දැකීමක් නිර්මාණය කළ හැකි මෙන් ම ඔවුන්ගේ ප්‍රජාවන් මුහුණ දෙන අභියෝගවලට මුහුණ දීම සඳහා හොඳම විසඳුම් ඔවුහු දැන සිටිති.

## පාර්ලිමේන්තුව කරා වන Voice මගින් සිදු කරන්නේ කුමක්ද?

Voice ඔස්සේ ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන්ගේ ජීවිතයට බලපාන කරුණු පිළිබඳව උපදෙස් වලට සවන් දෙන නිසා, ආදිවාසීන්ට සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන්ට බලපාන කරුණුවල දී වඩා හොඳ තීරණ ගැනීමට රජයට හැකි වනු ඇත.

## පාර්ලිමේන්තුව කරා වන Voice නියෝජනය කරන්නේ කවුද?

Voice, දුරස්ථ ප්‍රදේශ ඇතුළුව සෑම ප්‍රාන්තයක්ම සහ බල ප්‍රදේශයක් ම නියෝජනය කරන ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන්ගේ කණ්ඩායමක් වේ. ප්‍රාදේශීය ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන් නියෝජිතයන් තෝරා ගැනීම සිදු වේ.

## පාර්ලිමේන්තුව කරා වන Voice හි දී ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන්ගේ අදහස් විමසා තිබේද?

වසර ගණනාවක් තිස්සේ දහස් ගණනක් ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන් විසින් Voice අවශ්‍ය වන්නේ ඇයි සහ එය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා දී ඇත. ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන්ගෙන් 80% කට වඩා වැඩි පිරිසක් පාර්ලිමේන්තුව කරා වන Voice සඳහා සහයෝගය දක්වයි.

## නීති විශේෂඥයන් පවසන්නේ මොනවාද?

Voice නීත්‍යානුකූලව ශක්තිමත් බවත් එමගින් අපගේ ආණ්ඩු ක්‍රමය යහපත් කරන බවත් ෆෙඩරල් රජය නියෝජනය කරන නීතීඥයින් ඇතුළු ව්‍යවස්ථාපිත නීතීඥයින් විසින් පවසා ඇත.

## Voice මගින් නීති සකස් කළ හැකිද?

නැත. Voice හට නීති සම්පාදනය කිරීමට බලයක් නොමැත. එමගින් ආදිවාසීන්ට සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන්ට බලපාන කරුණු සම්බන්ධයෙන් උපදෙස් පමණක් සපයනු ඇත.

## ආදිවාසී හා ටෝ්රස් සමු ද්‍රසන්ධි දූපත්වාසී Voice ජනමත විචාරණයේ දී අසන ප්‍රශ්න මොනවාද?

“යෝජිත නීතිය: ආදිවාසී සහ ටෝ්රස් සමුද්‍රසන්ධි දූපත්වාසීන්ගේ Voice පිහිටුවීමෙන් ඔස්ට්‍රේලියාවේ ආදිවාසී සහ ටෝ්රස් සමුද්‍ර සන්ධි දූපත්වාසීන් පිළිගැනීමට ව්‍යවස්ථාව වෙනස් කිරීම. ඔබ මෙම යෝජිත වෙනස් කිරීම අනුමත කරනවාද?"



අනුමැතිය සහිතයි Tabatha Feher, Life Without Barriers, L6, 107 Pitt St, Sydney, NSW.

### මා ජනමත විචාරණයේ දී ඡන්දය භාවිතා කරන්නේ කෙසේද?

ජනමත විචාරණය මැතිවරණය හා සමාන වේ. ඔබට ඉහත ප්‍රශ්නය සහිත ඡන්ද පත්‍රිකාවක් ලබා දෙන අතර ඔබේ ඡන්දය ගණන් කිරීම සඳහා ඉංග්‍රීසියෙන් ‘YES’ (ඔව්) හෝ ‘NO’ (නැහැ) ලෙස සඳහන් කළ යුතුය. ඔබ ‘YES’ ලෙස සඳහන් කළ හොත් එයින් අදහස් වන්නේ ආදිවාසී සහ ටොරස් සමු ද්‍රසන්ධි දූපත්වාසීන්ට සෘජුව ම බලපාන කරුණු සම්බන්ධයෙන් වන Voice සඳහා ඔබ එකඟ වන බවයි.

### බහුතර ජනතාව YES (ඔව්) ලෙස ඡන්දය භාවිත කළහොත් කුමක් සිදු වේද?

බහුතර ජනතාව Voice සඳහා Yes (ඔව්) ලෙස ඡන්දය ප්‍රකාශ කළහොත්, රජය විසින් Voice පිහිටුවීම සඳහා අදාළ නීති සම්මත කිරීමට ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන්ගේ අදහස් විමසීම සිදු කරනු ඇත.

### බහුතර ජනතාව NO (නැහැ) ලෙස ඡන්දය භාවිත කළහොත් කුමක් සිදු වේද?

බහුතර ජනතාව ‘No’ ලෙස ඡන්දය ප්‍රකාශ කළොත් කිසිවක් වෙනස් නොවනු ඇති අතර ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන් මුහුණ දෙන ගැටලු ඒ ආකාරයෙන් දිගට ම පවතිනු ඇත. ‘No’ යනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අදහස් වන්නේ ඔබ හඬට එපා යැයි ඡන්දය ප්‍රකාශ කිරීම වන අතර මෙම ජනමත විචාරණයේ දී ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් වැසියන්ට සහාය දැක්වීමට වෙනත් විකල්පයක් නැත.

### මට වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොහෙන්ද?

**වැඩිදුර තොරතුරු**

www.lwb.org.au



අනුමැතිය සහිතයි Tabatha Feher, Life Without Barriers, L6, 107 Pitt St, Sydney, NSW.